00151 (සියළුම හිමිකම් ඇවිරිණි)

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 (1)

කළමනාකරණය හා සංවිධාන ක්‍රම (10)

කාලය පැය 03 යි.

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01 කළමනාකරණ ක්‍රියාවලිය දක්වා එහි එක් එක් පියවර කෙටියෙන් පැහැදිලි කරන්න.

02 කළමනාකරණ සංකල්ප විකාශනය සඳහා විද්‍යාත්ම කළමනාකරණ ගුරු කුලය සහ මානව සම්බන්ධතා ගුරු කුලය මගින් සිදු කරන ලද දායකත්වය කෙටියෙන් සාකච්ඡා කරන්න.

03 "අභිනියෝජනය"(delegation) යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? අභිනියෝජනයෙන් ආයතනයට ,එහි සේවකයන්ට සහ අධීක්ෂකයන්ට සැළසෙන යහපත පැහැදිලි කරන්න.

04 සාර්ථක කළමනාකරුවකුට කාල කළමනාකරණය අත්‍යාවශ්‍ය වේ. ඵලදායි ලෙස කාල කළමනාකරණය කිරීම සඳහා කළමනාකරුවකුට යොදාගත හැකි ක්‍රමවේද උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

05 වොරන් බෙනිස්ට අනුව "නායකත්වය යනු දැක්මක් (Vision) යථාර්ථයක් බවට පත් කිරීමට ඇති හැකියාවයි". නිදසුන් සහිතව මෙම ප්‍රකාශය විග්‍රහ කරන්න.

06 විධිමත් බව (Formalization) හා මධ්‍යගතකරණය (Centralization) යනු සංවිධාන වල වැදගත් පැතිකඩ (Dimensions) දෙකකි. සාකච්ඡා කරන්න.

07 වෙනස්වීමට එරෙහි විරෝධයට(resistance to change) මුහුණ පෑමට සිදුවීම ඕනෑම කළමනාකරුවකුට/ පරිපාලකයකුට, ඇති අභියෝගයකි. එවැනි අභියෝගයන් සාර්ථකව ජයගන්නේ කෙසේදැයි ඔබ දන්නා සංවිධාන ආශ්‍රයෙන් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

08 පහත සඳහන් ඒවා පිළිබඳ සටහන් ලියන්න.

(අ) මැක්ස් වෙබර්ගේ පරමාදර්ශී නිලබල ක්‍රමය

(ආ) මැස්ලෝ ගේ අවශ්‍යතා ධූරාවලි න්‍යාය

(ඇ) පුරවැසි ප්‍රඥප්තිය

(ඈ) සංවිධාන සංස්කෘතිය

*****************